# POLITICAL SCIENCE AND ITS SUB FIELDS (Part III)

# දේශපාලන න්‍යායය

නූතන දේශපාලන සහ සමාජ චින්තනයේ "න්‍යාය" යන සංකල්පය සාමාන්‍යයෙන් භාවිත වන්නේ සමාජයේ සිදුවන සංසිද්ධි එසේ සිදු වන්නේ මන්දැයි පැහැදිලි කිරීමට සහ විග්‍රහ කිරීමට ශාස්ත්‍රඥයන් භාවිත කරන විධික්‍රමික මෙවලමක් හැටියට ය. පහත සඳහන් උදාහරණ වලින් එය තේරුම් ගත හැකිය.

| සිදුවීම | අධ්‍යයන ක්ෂේත්‍රය | න්‍යායය |
|---|---|---|
| අවකාශයට ඇතුළුවන ද්‍රව්‍ය වස්තුවක් මහ පොළොව මතට පතිත වන්නේ ඇයි ? වෙනත් දිශාවක ගමන් නොකරන්නේ ඇයි? | භෞතික වාදය | ගුරුත්වාකර්ෂණ න්‍යායය |

ClassWork.LK

| | | |
|---|---|---|
| වෙළෙඳපොළේ භාණ්ඩ හිගවන විට ඒවායේ මිල ඉහළ යන්නේ ඇයි? | ආර්ථික විද්‍යාව | ඉල්ලුම සැපයුම පිළිබඳ න්‍යායය |
| සමාජ ආර්ථික පරිවර්තන සිදුවන විට සමහර සමාජ කොටස් අතර ක්‍රම විරොධී හැඟීම් සහ කැරලි ඇති වන්නේ ඇයි? | දේශපාලන විද්‍යාව | සාපේක්ෂ විහීනතා න්‍යායය (Relative deprivation theory) |

විද්‍යාවේ "න්‍යායය" යනුවෙන් හඳුන්වන දෙය කෙටි සංකල්පයක් බවට සූත්‍ර ගත කළ හැකි, හේතුඵල සම්බන්ධතාවේ තර්කණය අනවු ගොඩනගන විද්‍යාත්මක ප්‍රකාශයකි. විද්‍යාත්මක න්‍යාය සාමාන්‍යයෙන් ඉටු කරන කාර්යය නම්, ස්වාභාවික හෝ සමාජ හෝ දේශපාලන හෝ ලෝකයේ, අප නිරීක්ෂණය කරන සිදුවීම් එක එකක් ගැන නො ව, ඒවා සමන්විත වන අංග රාශියක්, එනම් සමස්ත ප්‍රපංචය, ගැන විග්‍රහ කිරීම් ඉදිරිපත් කිරීම යි.

ClassWork.LK

මේ අනුව න්‍යායයක් යනු ලෝකයේ සිදුවන පොදු ප්‍රපංචයන් ගැන පැහැදිලි කිරීමට විද්‍යාඥයන් භාවිත කරන ශාස්ත්‍රීය මෙවලමකි.

න්‍යාය ගොඩනැගීම ස්වාභාවික මෙන් ම සමාජීය විද්‍යාවන්ගේ එක් වැදගත් කාර්යයකි. දේශපාලන විද්‍යාවේ න්‍යාය යන සංකල්පයට අර්ථ දෙකක් තිබේ.

I. ප්‍රතිමානීය න්‍යායය (Normative Theory)
II. විද්‍යාත්මක න්‍යායය (Scientific Theory)

ප්‍රතිමානීය න්‍යායය යනු දේශපාලන දර්ශනය සහ දේශපාලන චින්තනය සමඟ අනන්‍ය වී ඇති න්‍යායය යි. එය ප්ලේටෝගේ සිට වර්තමානය පවතින දේශපාලන දර්ශන සම්ප්‍රදායය සමඟ සම්බන්ධ වී ඇත.

එම සම්ප්‍රදායය දේශපාලන න්‍යාය ලෙස ඉදිරිපත් කර තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම දේශපාලනය, රාජ්‍යය, දේශපාලන බලය, ආණ්ඩුකරණය හා රාජ්‍ය ප්‍රතිපත්ති කෙසේ විය යුතුදැයි යෝජනා කරන සෛද්ධාන්තික මුලධර්මය (axiomatic principles).

ClassWork.LK

රාජ්‍යය පිළිබඳ ඇරිස්ටෝටල්ගේ න්‍යායය, සමාජ ගිවිසුම පිළිබඳ හොබ්ස්ගේ හා ලොක්ගේ න්‍යායය, බලය පිළිබඳ ලිබරල්වාදී න්‍යායය යන මේවා ප්‍රතිමානීය න්‍යාය පිළිබඳ සම්භාව්‍ය උදාහරණ යි.

- ඒ සඳහා විසිවැනි සියවසේ උදාහරණ වන්නේ යුක්තිය පිළිබඳව ජෝන් රෝල්ස්ගේ න්‍යායය, සමූහාණ්ඩුවාදී නිදහස පිළිබඳව පිලිප් පෙටිත්ගේ න්‍යාය, මහජන පරිමණ්ඩලය පිළිබඳ හබර්මාස්ගේ න්‍යාය යන මේවා ය.

ClassWork.LK

# විද්‍යාත්මක න්‍යායය

දේශපාලන විද්‍යාවට විද්‍යාත්මකත්වය පිළිබඳ න්‍යායාත්මක අදහස එකතුවූයේ 1930 දශකයේය. එය සමාජීය විද්‍යාවන්ගේ ''විද්‍යාත්මක හැරීම'' පිළිබඳ පසුබිමෙනි. මෙම විද්‍යාත්මක වාදී සමාජීය විද්‍යා සම්ප්‍රදායෙහි දී න්‍යායය යන්න අර්ථකථනය කරනු ලැබූයේ, ස්වාභාවික විද්‍යා සම්ප්‍රදායෙහි දී න්‍යාය සංකල්පගත කළ ආකාරයටමය.

එනම්, න්‍යායයේ කාර්යය වන්නේ ලෝකයේ සිදුවන දේ එසේ සිදුවන්නේ මන්දැයි එසේ සිදුවන නීතියකට අනුව පැහැදිලි කිරීම ය. න්‍යායය යනු එවැනි නීති ගොඩනැගීමකි. ඒ අනුව න්‍යායයක් යනු ස්වාභාවික හෝ සමාජ හෝ ලෝකයේ සිදුවන දේ පැහැදිලි කිරීමේ නීතියකි.

විද්‍යාඥයන් තම පරීක්ෂණ මගින් න්‍යාය ගොඩ නගන්නේය යන්නෙහි අරුත ආනුභාවික දත්ත සහ සාක්ෂ්‍ය නිරීක්ෂණයට සහ විශ්ලේෂණයට භාජනය කර ''නීති'' පද්ධති ගොඩ නැගීමයි.

ClassWork.LK

සමාජීය විද්‍යාවේ ප්‍රත්‍යක්ෂ මූලවාද රාමුව ඇතුළත ගොඩනැගුන බැවින් දේශපාලන විද්‍යාවේ මෙම න්‍යායික ධාරාව හඳුන්වන්නේ ප්‍රත්‍යක්ෂ මූලවාදී දේශපාලන විද්‍යාන්‍යායය (Pasitivist Political Theory) වන.

චර්යාවාදය, තුළනාත්මක  දේශපාලන විද්‍යා විග්‍රහය, දේශපාලන නවීකරණය, හා දේශපාලන ක්‍රම පද්ධති යන 1930 දශකයෙන් පසු ව බිහි වූ දේශපාලන විද්‍යා ප්‍රවේශ දේශපාලන න්‍යාය යන්න දුටුවේ මෙම පර්යාලෝකය ඔස්සේය.

වර්තමාන දේශපාලන විද්‍යාවේ අප ඉහත දැක්වූ ප්‍රතිමානීය සහ විද්‍යාත්මක යන ප්‍රවේශ දෙක ම භාවිත වේ. මේ අතර විසිවැනි සියවසේ පැවැති සහ සමකාලීන ව පවත්නා දේශපාලන විද්‍යාව න්‍යායික ක්ෂේත්‍ර, ප්‍රවේශ හා මතධාරා ගණනාවකින්ම සමන්විත එකක් බව ද අපට නිරීක්ෂණය කළ හැකි ය.

Class Work LK

එවැනි ප්‍රධාන න්‍යායික ධාරා වන්නේ පහත සඳහන් ඒවාය.

- ලිබරල් දේශපාලන න්‍යායය
- සමූහාණ්ඩුවාදී දේශපාලන න්‍යායය
- මාක්ස්වාදී දේශපාලන න්‍යායය
- පශ්චාත් - මාක්ස්වාදී දේශපාලන න්‍යායය
- දේශපාලන නවීකරණ න්‍යායය
- ස්ත්‍රීවාදී දේශපාලන න්‍යායය
- පශ්චාත් - නූතනවාදී/පශ්චාත් ව්‍යූහවාදී දේශපාලන න්‍යායය
- පශ්චාත් - යටත්විජිතවාදී දේශපාලන න්‍යායය

ClassWork.LK

ClassWork.LK